**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව - 2021**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 ව්‍යාවනය කළ මතය**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 ව්‍යාවනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාවනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ ව්‍යාවනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ප්‍රකාශ නොකිරීම සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 48 ඡේදය ප්‍රකාරව, ප්‍රමිති මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර ආදායම් හා වියදම එකිනෙකට හිලව් නොකළ යුතු වුවත්, වර්ෂය තුළ දරන ලද නීති ගාස්තු වියදම වූ රු.24,137,438 ට එරෙහිව කොමිෂන් සභාව සතු ඉඩම් විකිණීමේදී ගැනුම්කරුගෙන් අයකර ගත් රු.2,717,462 ක මුදලක් හිලව් කර තිබුණි. | මේ දක්වා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අනුගමනයකළ ක්‍රමවේදය වූයේ නිතීඥ ගාස්තු ගෙවීමේදී එම ගෙවන වියදම නීති වියදම් ගිණුමට හර කිරීමටත්, ඉඩම් කට්ටිලාභින්ගෙන් කොමිෂන් සභාවට ලැබෙන නීති වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ ආදායම අදාළ නීති වියදම් ගිණුමට බැර කිරීමත්ය. ඔබගේ මග පෙන්වීම අනුව 2022 මූල්‍ය වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු සිදු කරනු ඇත. | ආදායම් හා වියදම් එකිනෙකට හිලව් නොකළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 99 ඡේදය මගින් පෙන්වා දී ඇති පරිදි, වෙනත් ආකාරයකින් සඳහන් කර ඇත්නම් හැර කාලපරිච්ඡේදය තුළ හඳුනාගත් සියලු ආදායම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ඉඩම් විකුණුම් ආදායමෙන් සියයට 40 ක් වූ රු.158,546,289 ක වටිනාකම විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ සටහන් නොකර සෘජුවම ප්‍රාග්ධන සංචිතයට බැර කර තිබුණි. | 2022 වර්ෂයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඉඩම් විකිණීමෙන් සහ අත්පත් ආදායමෙන් ලැබෙන සියලු ආදායම් විස්තීර්ණ ආදායම් ගිණුමේ පෙන්නුම් කර එයින් සංචිතයක් ලෙස මාරු කරනු ලබන ඉඩම් විකුණුම් හා අත්පත් ආදායම් වටිනාකමින් 40% ක ප්‍රමාණය සංචිත ගිණුමට මාරු කිරීමට කටයුතු කරනු ඇත. | සියලු ආදායම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02 හි 9 ඡේදය අනුව මාස 3 හෝ ඊට අඩු කාලයකින් කල්පිරෙන කෙටිකාලීන ආයෝජන, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී මුදල් හා මුදල් සමාන දෑ ලෙස හඳුනා ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් | මාස 03 ට හෝ ඊට අඩු කාලයකින් මුදල් හා මුදල් සමාන වත්කම් සියල්ල මුදල් හා මුදල් සමාන වත්කම් සේ සලකා 2022 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කරනු ඇත. | මාස 3 හෝ ඊට අඩු කාලයකින් කල් පිරෙන ආයෝජන මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේදී |

| | | | |
|---|---|---|---|
| | 31 දිනට පැවති එකතුව රු.1,334,716,557 ක් වූ කෙටිකාලීන තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් වටිනාකමහි ඇතුළත් මාස තුන හෝ ඊට අඩු කාලයක් තුළ කල් පිරෙන රු.209,963,420 ක කෙටිකාලීන ආයෝජන සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති මුදල් හා මුදල් සමාන දෑ ශේෂය තුළ ඇතුළත්ව නොතිබීම හේතුවෙන්, බැංකු කෙටිකාලීන තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන වටිනාකම එම අගයෙන් වැඩියෙන් ද, මුදල් හා මුදල් සමාන දෑ වටිනාකම එම අගයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි. | | මුදල් හා මුදල් සමාන දෑ ලෙස හඳුනාගත යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 08 හි 100 හා 105 ඡේද ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් හා වත්කම් පිළිබඳව සංක්ෂිප්ත විස්තරයක් මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඇස්තමේන්තු කර ගිණුම් ප්‍රතිපත්තිවල දක්වා ඇති රු.මිලියන 750 ක අසම්භාව්‍ය බැරකම් සහ රු.මිලියන 1491 ක අසම්භාව්‍ය වත්කම් සම්බන්ධව එසේ කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්කරණ සටහන් වලට අදාළ අසම්භාව්‍ය වත්කම් හා වගකීම් වලට අදාළ සංක්ෂිප්ත විස්තරයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම් පිළිබඳව යොමුගත ප්‍රමිතිය ප්‍රකාරව සංක්ෂිප්ත විස්තරයක් මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කරන බව අංක 1.6.2 දරන ගිණුම්කරණ ප්‍රතිපත්තියෙහි සඳහන් කර තිබුණ ද, ආයෝජන ආදායම්, ඉඩම් බදු කුලී, ඒ මත අයකරන අධිභාර සහ කලුගල් බදු ආදායම් හැර ඉඩම් අත්පත් වන්දි, ඉඩම් පරිහරණ ගාස්තු, ඉඩම් විකුණුම් අදායම්, ගස් විකුණුම් ආදායම්, පස් විකුණුම් ආදායම් වැනි අනෙකුත් ආදායම් වර්ග 19 ක් යටතේ එකතු කරගත් එකතුව රු.440,135,525 ක ආදායමක් මුදල් පදනම මත ගිණුම් ගත කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කළයුතු බැවින්, ඒ අනුව ලැබිය යුතු ඉඩම් බදු ආදායම්, ලැබිය යුතු ආයෝජන ආදායම්, ලැබිය යුතු කලුගල් ආදායම් ගිණුම්වලට ඇතුළත් කර ඇත. නිශ්චිතවම ලැබිය යුතු බවට හඳුනා ගැනීමට අපහසු, ඉඩම් අත්පත් වන්දි හා පොලී, පරිපාලන ගාස්තු, අයදුම්පත් ගාස්තු, වෙන්දේසි ආදායම්, පොල් ආදායම්, කොමිෂන් සභා ගාස්තු, ප්‍රවේණි ආදායම්, ලිපි නිකුත් කිරීම් ආදායම්, මුද්‍රණ පිටපත් නිකුත් කිරීම, ව්‍යාපෘති ගාස්තු, ලියාපදිංචි ගාස්තු, දැව විකුණුම් ආදායම්, පරිහරණ ආදායම්, පස් විකුණුම් හා ලිඳුල බංගලාවේ ආදායම් වැනි ආදායම් කාණ්ඩයන් මුදල් පදනම මත ගිණුම් ගත කර ඇත. ඉඩම් විකිණීම්වලට අදාළ තක්සේරුව | ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කළ යුතුය. |

පදනම්ව ඉඩම් පවරා දීමේදී අයවිය යුතු මුදල සකස් කරමින් පවතින අතර, ඉදිරියේදී උපචිත පදනමින් ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1972 වර්ෂයේ කොමිෂන් සභාව පිහිට වූ දින සිට අත්පත් කරගත් ඉඩම්වලට අදාළ, ඉඩම් අක්කර ගණන, එක් එක් ඉඩම් පිහිටි ප්‍රදේශ, අත්පත් කරගනු ලැබුවේ කවරෙකුගෙන්ද, දැනට භුක්තිය පවරාදීම් පිළිබඳ විස්තර හා අදාළ ගැසට් නිවේදන සහ ඉඩම් බැහැර කිරීම් වලට අදාළ සියලුම විස්තර පිළිබඳ වූ සම්පූර්ණ තොරතුරු ඇතුළත් ලේඛනයක් ආයතනය විසින් නඩත්තු කර නොතිබුණු අතර, ඒ පිළිබඳ උපයෝගී ලියවිලි මඟින් පැහැදිලි කිරීමටද ආයතනය අපොහොසත්ව ඇත. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු. 676,169,345 ක් වූ පවරාගත් ඉඩම්වල පැවැත්ම හා අගය කිරීමේ නිවැරදිතාවය පිළිබඳව විගණනයේදී සෑහීමට පත්විය නොහැකි විය. | විධිමත් හා කාලීනව යාවත්කාලීන වූ ඉඩම් ලේඛනයක් 1972 වසරේ ඉඩම් පවරාගන්නා අවස්ථාවේ සිට කොමිෂන් සභාව සකස් කර නොමැති බැවින් මෙම ගැටළුව මතු වී ඇත. පසුගිය වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන ආකාරයට 1975 වර්ෂයේ ඉඩම් වටිනාකම රු.890,959,772 ක් වන අතර පසු වර්ෂවල සිදු වූ ඉඩම් බැහැර කිරීම් වලින් පසුව 2006 වර්ෂයේ දී ඉඩම්වල වටිනාකම රු.676,169,346 ක් ලෙස පෙන්නුම් කෙරේ. එතැන් පටන් මේ දක්වා එම වටිනාකම නොවෙනස්ව පවතී. ඉඩම් ලේඛනය සකස් කිරීම මේ වන විට සිදු කරනු ලබන බැවින් ඉදිරියේදී මෙම ගැටලුව නිරාකරණය වනු ඇත. | කොමිෂන් සභාව විසින් අත්පත් කර ගත් ඉඩම් පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනයක් නඩත්තු කළ යුතු අතර ඉඩම් වටිනාකම් යාවත්කාලීනකර මූල්‍ය ප්‍රකාශන මගින් වාර්තා කිරීමටද කටයුතු කළ යුතුය. |
| (ආ) | 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ප්‍රකාරව, වතු සමාගම් වලින් සහ පුද්ගලයන්ගෙන් පවරාගත් ඉඩම් වෙනුවෙන් ගෙවිය යුතු වන්දි අවිනිශ්චිත (අධියර-I සහ II ) ගිණුමෙහි පැවති එකතුව රු.215,914,519 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂය අවසන්වන විට නිරවුල් කර නොතිබුණු අතර, වගකීමේ ස්වභාවය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් ගිණුම් සටහන් මගින්ද හෙළිදරව් කර නොතිබුණි. | 2022 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදියර I සහ අදියර II යටතේ ගෙවිය යුතු වන්දි හා වන්දි පොලී ගිණුම් පිළිබඳ සංක්ෂිප්ත සටහනක් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අවිනිශ්චිත ගිණුම් ශේෂය හඳුනා ගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. වගකීමේ ස්වාභාවය මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කළ යුතුය. |
| (ඇ) | කොමිෂන් සභාවේ ආදායම් අංශය මගින් පවත්වාගෙන යනු ලබන ඉඩම් බදු කුලී ලේඛනයේ ඇතුළත් ආයතන 9 ක් සහ පුද්ගලයින් 03 කට අදාළ රු.13,307,625 ක බදු කුලී ආදායමක් ගිණුම් මගින් මගහැරී තිබුණි. | දැනට ආදායම් අංශය මඟින් පවත්වා යනු ලබන බදු ලෙජරය බදු කාලසීමාව පදනම්ව සකස් කර ඒ අනුව තුළනය කරනු ලැබේ. ඒ අනුව, ගිණුම් කාලපරිච්ඡේදයට අදාළව තුළනය කිරීමක් සිදු නොකරන ලදී. නමුත්, 2022.12.31 දිනට, ගිණුම් කාලපරිච්ඡේදයට අදාළව බදු | බදු කුලී ආදායම නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ලෙජරය තුලනය කර ඒ අනුව ලැබිය යුතු බදු ආදායම අවසන් ගිණුම් වාර්තාවන්ට ඇතුළත් කිරීමට දැනටමත් කටයුතු කර ඇත. | |
| (ඇ) | කලුගල් බදු ගැනුම්කරුවන් 19 ක ගෙන් සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ලැබිය යුතුව පැවති රු.61,957,870 ක හිඟ බදු මුදලින් සමාලෝචිත වර්ෂයේදී ලද බදු මුදල රු.3,735,200 ක් වූ අතර හිඟ බදු ලියා හැරීමක් සිදුකර නොමැති හෙයින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ලැබිය යුතු කලුගල් බදු ආදායම රු.58,222,670 ක් විය යුතු වුවත්, එය සදොස්ව රු. 13,237,050 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන මගින් වාර්තා කර තිබුණි. මේ හේතුවෙන් ලැබිය යුතු කලුගල් බදු ආදායම රු.44,985,620 ක් අඩුවී තිබුණද එයට හේතු දක්වා නොතිබුණි. | ව්‍යාපෘති අංශය තුළ කලුගල් සම්බන්ධයෙන් විධිමත් බදු ලෙජරයක් පවත්වාගෙන ගොස් නොමැති අතර ලෙජරය සකස් කිරීම ප්‍රමාද වී ඇත්තේ මේ සම්බන්ධයෙන් ගැටලු රාශියක් පැනනැගීම හේතුවෙනි. විශේෂයෙන්ම ආරම්භයේ සිටම කලුගල් බදුදීම් වලදී අය කරන ගාස්තුව විටින් විට වෙනස්වීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. කෙසේ නමුත් ඉහතින් සඳහන් කළ කරුණු සම්බන්ධයෙන් නැවත අධ්‍යයනයක් කර නිසි පරිදි ගොනු සකස් කර නිවැරදි බදු ලෙජරයක් සකස් කිරීම සඳහා ආදායම් අංශය වෙත පවරා ඇති අතර ඒ සඳහා අවශ්‍ය සියලු පහසුකම් ලබා දී මේ වන විට එම ලෙජරය සකස් කරමින් පවතී. ඒ අනුව සිදු වී ඇති දෝෂයන් බදු ලෙජරය යාවත්කාලීන කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු අතර 2022 වර්ෂයේ ගිණුම් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයට පෙර බදු දී තිබුණු එහෙත් ගිණුම් මගින් වාර්තා නොකළ කලුගල් බදුකරුවන් 12 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.136,773,278 ක මුදලක් වර්ෂයේ ආදායමට ඇතුළත් විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ සම්පූර්ණ ආදායම ලෙස රු.116,694,834 ක් පමණක් මූල්‍ය ප්‍රකාශන මගින් දක්වා තිබීම හේතුවෙන්, කලුගල් බදු ආදායම රු.20,078,444 ක් අඩුවෙන් සටහන් වී තිබුණි. | සමාලෝචිත වර්ෂයේ නව බදු කරුවන් 12 දෙනෙකු වෙත කලුගල් ඉඩම් බදුදීම් ලබාදීමක් සිදු වී නොමැති අතර එම ලේඛනයේ සඳහන් බදුකරුවන් ඊට පෙර වර්ෂවල සිටම සිය ව්‍යාපෘති පවත්වාගෙන ගොස් ඇති බවට තහවුරු වී ඇත. කෙසේ නමුත් මෙම බදුකරුවන්ගේ ලිපි ගොනු අත්හැරී ඇති අතර මේ වන විට එම ලිපිගොනු සකස් කර ඇත. තව ද එම බදු කරුවන්ගෙන් අය විය යුතු මුදල් අය කිරීම සඳහා දිස්ත්‍රික් කාර්යාලයෙන් දැනුවත් කර ඇති අතර, මුදල් නොගෙවන ලද බදුකරුවන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීමට ද කටයුතු කර ඇත. කෙසේ නමුත් මෙම බදු ආදායම අත්හැරීම බදු ලෙජරය සකස් කිරීමෙන් අනතුරුව නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂයේ ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතු අතර 2022 වර්ෂයේ ගිණුම් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ඉඩම් බදුකරුවන් 12 දෙනකුගෙන් අයවිය යුතු රු.101,255,194 ක හිඟ බදු ශේෂ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර නොතිබුණි. | මෙම බදුකරුවන් 12 දෙනාට අදාළව ලැබිය යුතු බදු ආදායම් 2021.12.31 දිනෙන් පසුව අනාවරණය කරගෙන ඇති බැවින්, දැනට ලෙජරයට ඇතුළත් කර බදුකරුවන්ද දැනුවත් කර ඇත. ඒ අනුව, 2022.12.31 දිනට ලැබිය යුතු බදු මුදල් වලට ඇතුළත් කරනු ලැබේ. | අයවිය යුතු හිඟ බදු ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතු අතර 2022 වර්ෂයේ ගිණුම් මගින් නිවැරදි කිරීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | | | කළ යුතුය. |
| (උ) | ඉඩම් බදුකරුවන් 09 දෙනෙකුට අදාළව කොමිෂන් සභාවේ ආදායම් අංශය මගින් පවත්වාගෙන යනු ලබන ශේෂය සහ සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ශේෂයන් අතර රු.2,827,941 ක වෙනසක් පැවතුණි. | 2021.12.31 දිනට ලැබිය යුතු බදු ආදායම් ලේඛනය සකස් කිරීමේදී තාවකාලික සංශෝධනය පදනම්ව වාර්ෂික බදු මුදල ගණනය කර ඇති අවස්ථා දක්නට ලැබේ. පසුව විගණන අංශය වෙත බදු ලෙජර් ලබා දෙන අවස්ථාව වන විට ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව ලැබී තිබුණු බැවින්, ඒ අනුව ගැලපීම් කර ඇත. මෙම ගැලපීම් මතද මූල්‍ය ප්‍රකාශනවලට ලබාදී තිබුණු ශේෂය හා බදු ලෙජරයේ ශේෂය වෙනස් වී ඇත. | මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ශේෂයන් අදාළ උපයෝගී ලේඛන වල අගයන් සමඟ සමාන විය යුතුය. |
| (ඌ) | කළුතර දිස්ත්‍රික්කයේ අම්රිතා ඇපරල් (පෞද්ගලික) සමාගම වෙතින් ලැබිය යුතු ලෙස පෙර වර්ෂවලදී හඳුනා නොගත් රු.1,851,852 ක ඉඩම් කල්බදු මුදලක්, සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු අතර, එය පෙර වර්ෂ ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස සටහන් කිරීම හේතුවෙන්, එම අගයෙන් ඉඩම් බදු ආදායම වැඩියෙන් සටහන් වී තිබුණි. | බදු ලෙජරය අනුව 2021.01.01 දිනට ආරම්භක ශේෂය රු.4,142,819 කි. 2020 දෙසැම්බර් මස රු.2,000,000 කට අදාළ චෙක්පත අම්රිතා ඇපරල් (පුද්) සමාගමෙන් ලැබී තිබුණි. මෙම චෙක්පත අදාළ බදු මුදල රු.1,851,851 කි. මෙම බදු මුදල අඩු කිරීමෙන් පසු (4,142,819–1,851,851) 2021.01.01 දිනට ශේෂය ලෙස රු.2,290,967 ක් මුදල අවසන් ගිණුම් වාර්තාවල පෙන්වා ඇත. එහෙත් මෙම චෙක්පතට අදාළව රිසිට්පත 2021.01.11 දිනැතිව නිකුත් කර තිබුණි. (චෙක්පතට දින යොදා තිබූ බැවින්) දැනට මෙම ආයතනයට අදාළ සියලුම බදු මුදල් ලැබී ඇත. | සමාලෝචිත වර්ෂයේ ආදායම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.2,886,619,681 ක් වටිනා ලැබිය යුතු කළුගල් බදු, ඉඩම් බදු, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ සහ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂවල නිවැරදිතාවය තහවුරු කිරීම සඳහා ලෙජර් ගිණුම්, ශේෂ සනාතන ලිපි යනාදි තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉඩම් බදුදීමට අදාළව ආදායම් අංශය විසින් පවත්වා ගෙන යන දිස්ත්‍රික්ක 18 ක බදු ලෙජරයන් 2022.09.05 දින වන විට විද්‍යුත් තැපැල මගින් රජයේ විගණන අංශය වෙත ලබාදී ඇති අතර දැනට විධිමත් කලුගල් ලෙජරයක් පවත්වා ගෙන ගොස් නොමැති බැවින්, කලුගල් ලෙජර් ගිණුම් සකස් කරමින් පවතී.<br>ණයගැතියන් වන හදබිම අධිකාරිය, ශ්‍රී ලංකා වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ඉඩම් අමාත්‍යාංශය, ජාතික කඩදාසි සමාගම සඳහා හා ණයහිමියන් වන මහවැලි අධිකාරිය, ඇටර්නි ජෙනරාල් දෙපාර්තමේන්තුව යනාදී ආයතන වෙත 2022.01.24 දින ශේෂ සනාථ කිරීම කිරීමේ ලිපි යවා ඇත. | විගණනයට මෙහි සඳහන් ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු. 2,987,753,606 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයෙහි ඇතුළත් රාජ්‍ය ආයතන 07 කින් ලැබිය යුතු වර්ෂ 30 ඉක්ම වූ රු.2,127,271,837 ක් සහ වර්ෂ 10 ඉක්ම වූ රු. 8,354,409 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම කොමිෂන් සභාවට අයවිය යුතු මුදල් ගෙවීම් කරන ලෙස දැනුම් දුන්නද, එම මුදල් කිසිදු ආයතනයක් විසින් කොමිෂන් සභාවට ගෙවා නොමැත. හදබිම අධිකාරිය, ශ්‍රී ලංකා වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ඉඩම් අමාත්‍යාංශය යන ආයතන අප වෙත පසුගිය වසර කිහිපයේම දන්වා එවා ඇත්තේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන වල කොමිෂන් සභාවට ලැබිය යුතුව ඇති වටිනාකම් ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු වටිනාකම් ලෙස පෙන්නුම් නොකරන බවයි.<br>විවිධ සේවා සමුපකාර සමිති සමාගම්, මැතිවරණ ඉඩම් ප්‍රතිසංස්කරණ සමුපකාර සමිති සමාගම, ජාතික කඩදාසි සමාගම යන ආයතන දැනට ක්‍රියාකාරීත්වයේ නොමැති බැවින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයවිය යුතු මුදල අයකර ගැනීම සිදු කළ නොහැකි මට්ටමක පවති. මෙම නිරවුල් කරගැනීම සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය සහ අදාළ අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සාකච්ඡා කර තීරණයක් ගැනීමට සැලසුම් කර ඇත. | රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු පැරණි ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්ක දෙකෙහි පිහිටි ඉඩම් කැබලි 08 ක් බදු ගත් පුද්ගලයින් ගෙන් අයවිය යුතු රු.2,311,017 ක් වර්ෂ 22 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණද, අදාළ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කළුතර දිස්ත්‍රික්කයේ බරෝඩේල් වත්තේ කැබලි අංක 07 කොටස කේ.ඒ. වසන්ත නැමති කට්ටිකරුට ඔප්පුව ලබාදී ඇත. එම්.ඩී.එස්. ප්‍රියන්ත යනුවෙන් නමක් පිඹුරුපතේ සඳහන්ව නැත. මිල්ලෑව වත්තේ කේ.ඒ. පාලිත යන අය පදිංචිව සිටී. ඊට අදාළ මුදල් ගෙවන ලෙස අදාළ අය දැනුවත් කර ඇතත්, ගෙවීම් කිරීමට අපහසු බව දන්වා ඇත. ඉලිඹ වත්තෙහි පදිංචි පී. තිලකසිරි සහ ඩී.ආර්. හේමලතා යන අයට ඔප්පුව ලබාදී ඇත. එම්.එස්.ඩී. සේනාධීර යන අය පිළිබඳ කිසිදු තොරතුරක් ගොනුවල සඳහන් නොවේ. ගම්පහ දිස්ත්‍රික්කයේ කහටගහ වත්ත නැමති ඉඩමේ පී.එල්.සරත්චන්ද්‍ර නැමති අය සම්බන්ධයෙන් තොරතුරු සොයාගත නොහැක. තව ද, පාලු වත්ත ඉඩමේ එම්.ඩී.මේරි බෙන්ටා යන අයගෙන් රු.112,322 ක මුදලක් අය කරගෙන ඇත. | බදුකරු විසින් ගිවිසුමේ නියමයන් හෝ කොන්දේසි කඩකරන්නේනම් ඉඩම් ප්‍රතිසංස්කරන පනතේ 24(2) ප්‍රකාරව පවරාදීම් අවලංගු කළ යුතු අතර අනෙකුත් බදුකරුවන්ගෙන් හිඟ මුදල් අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.14,080,850 ක් වූ ඉඩම් බදුකුලී අත්තිකාරම් ගිණුම් ශේෂයේ ඇතුළත් පුද්ගලයින් 269 දෙනෙකුගෙන් ලබාගත් රු.11,215,815 ක අත්තිකාරම් මුදල් වර්ෂ 16 කට වැඩි කාලයක සිට රඳවාගෙන තිබුණ ද, අදාළ ඉඩම් නීත්‍යානුකූලව බදු දීමට හෝ අත්තිකාරම් නැවත පියවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. | 2002 – 2004 කාලය තුළ පවරන ලද ඉඩම් 219 කට අයත් අක්කර 11,942 කට අදාළ ඉඩම් ප්‍රමාණයෙන් ඉඩම් අක්කර 1,156 ක් දැනට සරුසාරව වගා කර ඇති බවට හඳුනා ගෙන ඇති අතර අනුමැතිය ලබාගැනීම සඳහා කෙටුම්පත් කරන ලද කැබිනට් පත්‍රිකාව 2022.04.20 දින ඉඩම් අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. අනතුරුව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර අදාළ බදුකරුවන් සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය වෙත කැඳවා සාකච්ඡා කරන ලදී. මෙම කරුණ සම්බන්ධව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද පසු, ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට නියමිතය. | අදාළ ඉඩම් නීත්‍යානුකූලව බදු දීමට හෝ අත්තිකාරම් නැවත පියවීමට කටයුතු කළ යුතු අතර වගාබිම් පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.11,392,992 ක් වූ ඉඩම් විකුණුම් අත්තිකාරම් ශේෂයෙහි වර්ෂ 10 කට වැඩි කාලයක සිට පවත්වාගෙන එන එකතුව රු.10,377,992 ක ශේෂ ඇතුළත්ව තිබුණු මුත් ඒවා නිරවුල් කිරීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. | ගිණුම්ගත වී ඇති මෙම ඉඩම් විකුණුම් අත්තිකාරම් මුදල් වැඩි වශයෙන් 2002-2004 කාලය තුළ සිදුකරන ලද ගනුදෙනු වන අතර එකී ඉඩම් ගනුදෙනු සම්බන්ධයෙන් මේ වන විටත් අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශයක් ඉදිරිපත් කර ඇති අතර එම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද පසුව මෙකී නිරවුල් නොවූ අත්තිකාරම් ගනුදෙනු නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | විකුණුම් අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මු.රෙ.371 (5) | තත්කාර්ය අතුරු අග්‍රිමයක් අදාළ කාර්ය නිමකර දින 10 ක් ඇතුළත පියවිය යුතු වුවද, අවස්ථා 19 ක දී දෙන ලද රු.709,275 ක් වටිනා අතුරු අග්‍රිම පියවීමට දින 55 සිට දින 263 ක් දක්වා කාල පරාසයක් ප්‍රමාද වී තිබුණි. | ඉදිරියේදී මෙවැනි ගැටලු ඇති නොවීම සඳහා ලබා දෙනු ලබන අත්තිකාරම් ලබා දී දින 07 ක් ඇතුළත පියවිය යුතු බවට අදාළ අත්තිකාරම් ලබා ගත් නිලධාරින් දැනුවත් කර ඇත. එසේ ලබා ගත් අත්තිකාරම් දින 07 ක් ඇතුළත නොපියවන්නේ නම් අදාළ මස හෝ ඊළඟ මස ඔහුගේ පෞද්ගලික වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කරනු ඇත. | නියමිත පරිදි අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මු.රෙ.751 | සියලුම භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් ලේඛනගත කළ යුතු වුව ද, කොමිෂන් සභාව සඳහා දුරකථන පද්ධතියක් ස්ථාපිත කිරීමට අදාළව රු.245,700 ක් වැයකර සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු, ඩිජිටල් දුරකථන 05 ක් හා සාමාන්‍ය දුරකථන 40 ක් ඉන්වෙන්ට්‍රි ගත කර නොතිබුණු අතර, මෙම උපකරණ භාවිතාකරන හෝ භාරයේ පවතින නිලධාරීන්ගේ නාමලේඛනයක් ගොනු ගත කර නොතිබුණි. | මේ වන විට මෙම දුරකථන 45 සඳහා ලැබීම් හා නිකුත් කිරීම් විධිමත්ව ලේඛන ගතකර ඇත. තවද, මෙම දුරකථන තොග සමීක්ෂණ වාර්තාවන්හි අන්තර්ගත කිරීම සිදුකොට ඇත. | මු.රෙ. 751 හි විධිවිධාන ප්‍රකාරව භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් ලේඛන ගතකළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 ඡේදය | වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වුවද, කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ (ඉඩම්) සහ අධ්‍යක්ෂ (පාලන හා ලේකම්) යන තනතුරු තුන සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් පත්කර මාස 05 සිට මාස 12 අතර කාලයක් ගතවී තිබුණද, ස්ථිර පදනම මත අදාළ තනතුරු සඳහා නිලධාරීන් පත්කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා තීරණ අනුව මෙම පත්කිරීම් සිදුකර ඇත. එම නිලධාරීන් එම තනතුරු සඳහා සුදුසුකම් සම්පූර්ණ කර ඇති අතර ස්ථිර පදනමින් අභ්‍යන්තරව බඳවාගැනීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමට 2022.11.14 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත. | පුරප්පාඩු සඳහා ස්ථිර නිලධාරීන් පත් කළ යුතුය. |
| (ඇ) | 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි (ආ) වගන්තිය | චක්‍රලේඛය ප්‍රකාරව තනතුරු අලුතින් ඇති කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එසේ නොමැතිව සමාලෝචිත වර්ෂය අවසන් වන විට සංචාරක බංගලා භාරකරු යන තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගෙන තිබුණි. | 2020.12.09 දින පැවති 741 වැනි කොමිෂන් සභා වාරයේදී ගනු ලැබුණු තීරණයක් අනුව, නුවරඑළිය සංචාරක නිවාඩු නිකේතනය සඳහා මෙම සේවකයා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති අතර, නව තනතුර අනුමත නොවුන හොත් එම අය මෙම තනතුරෙන් ඉවත් කිරීමේ හැකියාව පවතින බවද සඳහන් කරමි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව රාජකාරී අවශ්‍යතාවයන් මත බඳවා ගැනීම් සිදු කළ යුතුය. |
| (ඈ) | 2021 නොවැම්බර් 17 දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ | පවරාගත් ඉඩම් පිළිබඳ පිළිගත හැකි ලේඛනයක් සකස් කිරීම, වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු | ඉඩම ලේඛනය සකස් කිරීමේ කටයුතු අධියර 03 ක් යටතේ සිදුකරන අතර පළමු අධියර අවසන් කර ඇති අතර දෙවන හා තෙවන අදියරන් සිදුකෙරෙමින් පවතී. වාර්ෂික වාර්තා සහ | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග පරිදි අදාළ ගැටලු නිරාකරණය |

| | | |
|---|---|---|
| අනුමැතියකින් තොරව 2018 වර්ෂයේදී බඳවාගනු ලැබූ අතිරේක කාර්යය මණ්ඩලය සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පරීක්ෂණයක් පවත්වා ඒ අනුව ඉදිරි කටයුතු කිරීම, 2002-2004 කාලයේදී විධිමත් අනුමැතියකින් තොරව පවරාදුන් ඉඩම් පිළිබඳව ඉදිරි කටයුතු කිරීම, කොමිෂන් සභාව සතු ඉඩම් අගය කිරීම සඳහා කටයුතු කිරීම, විගණන වාර්තා මගින් අනාවරණය කර තිබූණු ගැටලු නිරාකරණය කර මාස 06 ක් ඇතුළත වාර්තා කිරීම සිදු කළයුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | විගණිත මූල්‍ය ප්‍රකාශන පවත්නා තත්ත්වයෙන් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලෙස දන්වා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා කෙටුම්පතක් සකස්කර 2022.10.17 දින සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. 2018 වර්ෂයේදී බඳවාගත් අතිරේක කාර්යය මණ්ඩලය සම්බන්ධයෙන් වාර්තාවක් 2022.05.24 දින අමාත්‍යාංශය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. බඳවා ගැනීමේ පරිපාටියක් සකස්කර ඇති අතර එය ඉදිරියේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට නියමිතය. 2002 – 2004 කාලය තුළ බැහැර කළ ඉඩම් 40 ක් සම්බන්ධයෙන් වාර්තාවක් සකස්කර පොදු ව්‍යාපාර කාරක සභාව වෙත යොමුකර ඇති අතර ඉතිරි ඉඩම් සම්බන්ධයෙන් ක්ෂේත්‍ර මට්ටමින් තොරතුරු රැස්කරමින් පවතී. මේ පිළිබඳව කැබිනට් පත්‍රිකාවක් සකස්කර අමාත්‍යාංශය වෙත යොමුකර ඇති අතර ලැබෙන උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදුකරනු ඇත. ඉඩම් ලේඛනය සකස් කිරීමෙන් පසුව වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට සැලසුම්කර ඇත. විගණන වාර්තා මගින් අනාවරණය කර තිබුණු ගැටලු නිරාකරණය කරමින් පවතී. | කිරීම හා වාර්තා කිරීම සිදුකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.151,738,564 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 419,612,386 ක් විය. ඒ අනුව රු. 267,873,822 ක අතිරික්තයෙහි අඩුවීමක් නිරීක්ෂණය විය. මෙම අඩුවීමට පරිපාලන වියදම්, සැපයුම් වියදම් හා වෙනත් ක්‍රියාකාරී වියදම් පිළිවෙළින් රු.302,490,906, රු.15,554,581, රු.15,342,692 කින් වැඩිවීම සහ මූල්‍ය ආදායම රු.49,996,061 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඉඩම් විකුණුම් ආදායම, ඉඩම් පරිහරණ ආදායම සහ කලුගල් බදුකුලී ආදායම් සියයට 33, 76 සහ 97 ක අගයන්ගෙන් වැඩිවන විට ඉඩම් බදුකුලී ආදායම සහ ස්ථාවර තැන්පතු පොලී ආදායම සියයට 15 ක සහ සියයට 33 ක අගයන්ගෙන් අඩුවී තිබුණි.

(ආ) පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වියදම, වාහන අලුත්වැඩියා වියදම, ප්‍රවාහන දීමනා, ඉන්ධන දීමනා, වාහන කුලී වියදම් සහ නීති වියදම් සියයට 84 සිට සියයට 5074 දක්වා පරාසයකින් වැඩි වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 29 : 1 ක් වූ අතර 2020 වර්ෂයේ එම අනුපාතය 38 : 1 ක් විය. ඒ අනුව ජංගම අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව පහළ අගයකින් පවත්වාගෙන ගොස් තිබුණද කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වලට වැඩියෙන් ජංගම වත්කම් වල මුදල් ආයෝජනය කර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) 2020 වර්ෂයේ සියයට 8 ක් ව පැවති තෝලන අනුපාතය සමාලෝචිත වර්ෂය වන විට සියයට 11 ක් දක්වා වැඩි වී තිබුණද, කොමිෂන් සභාව විසින් මුලු වගකීම් පියවීමට අවශ්‍ය ප්‍රමාණයට වැඩි හිමිකම් ප්‍රාග්ධනයක් පවත්වාගෙන ගොස් ඇති බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සඳහා ඉඩම් ලේඛනයක් සැකසීමේ අවශ්‍යතාවය මත සමාලෝචිත වර්ෂය තුළ දී රු.19,793,965 ක කුලී සහ ඉන්ධන පිරිවැයක් දරා කුලී කැබ් රථ 10 ක් ධාවනයේ යොදවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉඩම් ලේඛනය සම්පූර්ණ කර නොතිබුණි. | දිස්ත්‍රික් කාර්යාල වෙතින් ලද ඉඩම් තොරතුරු නිශ්චිතව හඳුනා ගැනීම සඳහා ක්ෂේත්‍ර රාජකාරි යෙදීමෙන් යුතුව සිදු කළ යුතු වූ බැවින් ආයතනයේ පැවති රාජකාරී වාහන ප්‍රමාණයද සීමා සහිතව පැවති බැවින් මෙසේ කුලී පදනම මත ලබාගත් වාහන යොදා ගනිමින් එකී රාජකාරි ඉටුකර ගැනීමට කටයුතු කරන ලදී. ඊට අමතරව කොමිෂන් සභාව මගින් පවත්වාගෙන යනු ලැබූ කාබනික පොහොර ව්‍යාපෘතියේ රාජකාරි කටයුතු සඳහා ද කුලී පදනම මත ලබාගත් වාහන ද යොදාගැනීමට සිදු වූ බව සඳහන් කරමි. තව ද, කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ඉඩම් ලේඛනය සැකසීමේ කටයුතු අවසන් කිරීමට නොහැකි විය. | සම්පත් කාර්යක්ෂමව, ඵලදායීව සහ සකසුරුවම්ව යොදා ගෙන අදාළ කාර්යයන් වහාම නිමකළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------- | -------------- |
| (අ) | බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ග්ලේන් ඇල්පින් වත්ත නැමැති ඉඩමෙන් අක්කර 04 රූඩ් 02 ක ප්‍රමාණයක් 1978 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා වර්ෂ 31 ක් ශ්‍රී කාලි අම්මාන් කෝවිල විසින් අනවසරයෙන් භුක්තිවිඳ ඇති බැවින් 2009 වර්ෂයේදී පරිපාලන ගාස්තු අයකිරීමට තීරණය කළ බව කෝවිලේ පරිපාලනය වෙත සභාව විසින් දැනුම් දී තිබුණද, අදාළ ගාස්තු ගණනය කර කෝවිල වෙත දැනුම් දීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. තවද, 2009 වර්ෂයේදී දේවාල පරිශ්‍රය පිහිටි අක්කර 2 ක කොටසක් විකිණීමෙන් පවරා දීමටත් තවත් අක්කර 4.2 ක ප්‍රමාණය බදු පදනමට ලබා දීමටත් කටයුතුකර තිබුණු අතර, ඊට අදාළව 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයවිය යුතු රු.6,043,499 ක ඉඩම් බදු මුදල අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | 2009 වසරේ සිට රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ඉඩම් බදු ගණනය කර කෝවිල් පරිපාලන සභාව වෙත දැනුම් දී තිබුණද, මුදල් ගෙවා නොමැති අතර, කොවිඩ් වසංගත උවදුර නිසා බදු මුදලෙන් 50% අඩුකර දෙන ලෙස ඉල්ලීම් කර ඇත. ඒ අනුව ඉඩමේ සංවර්ධන කටයුතු මෙතෙක් සිදුකර නොමැති බැවින් ඉඩමේ ප්‍රායෝගික භුක්තිය දිස්ත්‍රික් අධ්‍යක්ෂ වෙත භාර දීමට කටයුතු කරන ලෙසට 2022.10.05 දින ශ්‍රී කාලි අම්මාන් කෝවිල් පරිපාලන සභාව වෙත දැනුම් දී තිබුණ ද, එසේ භුක්තිය භාරදීමක් සිදු නොකර මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට 2022.10.31 දින ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයට පැමිණ ඇත. එම සාකච්ඡාවේ දී තීරණය වූ පරිදි බදු ගෙවීම්වලට අදාළ යෝජනාවලියක් 2022.11.05 දිනැතිව යොමුකර ඇති අතර එම යෝජනාවලිය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තීරණයක් ගැනීමට නියමිතය. | පරිපාලන ගාස්තු හා බදු, හිඟ මුදල් ද සමඟ අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි කොටගලවත්ත නැමැති ඉඩමෙන් අක්කර 75 ක් වලංගු ගිවිසුමක් නොමැතිව, ප්‍රීතිපුර ළමා නිවාසය සඳහා වර්ෂ 30 ක කාලයක් සඳහා බදු දී තිබුණු අතර, අදාළ බදු කාලය 2009 වර්ෂයේදී අවසන් වී තිබුණද, 2009 වර්ෂයේ සිට වලංගු ගිවිසුමකට එළඹීමකින් තොරව අදාළ ඉඩම පරිහරණය කිරීමට කොමිෂන් සභාව අවස්ථාව ලබා දී තිබුණි. තවද, එම බදුකරුගෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට හිඟව පැවති රු.15,272,260 ක බදු මුදල අයකර ගැනීමට කටයුතු නොකර ලැබිය යුතු | 2021.11.08 දින ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා කළ සාකච්ඡාවේදී 2009 වසරේ සිට බදු මුදල් ගෙවන බවට එකඟ වූ නමුත් එම මුදල් නොගෙවීම හා ඉදිරි පියවර සම්බන්ධයෙන් ගනු ලැබූ කොමිෂන් සභා තීරණයක් අනුව, බදු ප්‍රතිශතය 2% අනුපාතය යටතේ 2009 වසරේ සිට බදු දීමටත්, හිඟ බදු මුදල් වසර 10ක් තුළ අය කර ගැනීමටත්, බදු ගිවිසුම ලබා දීමේදී හිඟ බදු මුදල ඇතුළත් කිරීමටත්, වසර 03 ක් තුළ ඉඩම සංවර්ධනය කිරීමටත්, ප්‍රීතිපුර ළමා නිවාසයේ පාලක මණ්ඩලයේ නිලධාරීන් සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම් දීමට තීරණය කර ඇත. ඒ | ඉඩම් වලංගු ගිවිසුමකට අනුව බදු දිය යුතු අතර හිඟ මුදල් අයකර ගැනීමට ද කටයුතු කළ යුතුය. ලැබිය යුතු මුදල් ලියාහරින්නේ නම් මු.රෙ.113 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හිඟ බදු ආදායම රු.6,581,479 ක් දක්වා අඩුකර තිබුණි. | අනුව, 2022.10.06 දින ප්‍රීතිපුර ළමා නිවාසයේ අධ්‍යක්ෂ වෙත අංක 11885 කොමිෂන් තීරණය සහ 2022.12.10 දිනට හිඟ බදු මුදල රු.6,581,479 ක් බව දන්වා ඇත. | |
| (ඇ) | ගාල්ල දිස්ත්‍රික්කයේ මහහේන්තැන්න වත්ත ඉඩමේ අක්කර 10 ක ප්‍රමාණයක් එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමය යටතේ නිවාස සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා "ඇල්පිටිය ඉහළ ප්‍රදේශයේ ස්වයං රැකියා නියුක්තිකයන්ගේ සමාජ සුභසාධන සමිතිය" වෙත ලබාදීමට අමතරව, ගිවිසුමක් මගින් අදාළ ඉඩමේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු.1,000,000 ක අත්තිකාරම් මුදලක් කොමිෂන් සභාව විසින් සියයට 10 ක වාර්ෂික පොලියට මාස 6 ක් තුළ ආපසු ගෙවීමේ පදනම මත 2019 වර්ෂයේදී ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණු අතර, අත්තිකාරම් මුදල සහ පොලිය අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම් කොටස ඇල්පිටිය, ඉහළ, අමුණ මාවත, ස්වයං රැකියා නියුක්තිකයන්ගේ සමාජ සුභසාධක සමිතියේ ඉල්ලීම මත කොමිෂන් සභාව විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 44 ඒ වගන්තියේ සඳහන් බලතල ප්‍රකාරව කටයුතු කරමින් අදාළ පාර්ශවයන් සමඟ නීත්‍යානුකූල ගිවිසුමකට එළඹීමෙන් අනතුරුව යෝජිත මුදල නිදහස් කිරීමට තීරණය කර ඒ අනුව රු.ලක්ෂ 10 ක මුදලක් 2019.03.26 දින පොරොන්දු ගිවිසුමකට එළඹීමෙන් පසු ඉඩමේ සංවර්ධන කටයුතු සඳහා ලබා දී ඇත. එසේ වුවත් අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නැත. ඒ අනුව මෙම සමිතියට එරෙහිව නඩු පැවරීමට එන්තර වාසියක් 2021.11.11 දාතමින් යුතුව යොමු කර ඇති අතර මුදල් නොගෙවීම හේතුවෙන්, කඩුවෙල දිසා අධිකරණයේ අංක 8080/M නඩුව ගොනු කර ඇති අතර එම නඩුව 2022.11.24 දිනට සිතාසි වාර්තා සඳහා ගරු අධිකරණයේ කැඳවීමට නියමිතය. | ඉඩම නැවත පවරාගෙන පනතේ අරමුණු වෙනුවෙන් යොදවා ගැනීමට හා ණය පදනම මත ලබාදුන් රු.1,000,000 ක මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මඩකලපුව දිස්ත්‍රික්කයේ පිහිටි කිරිමුට්ටිවත්ත නැමැති ඉඩමෙන් අක්කර 04 ක් පුද්ගලික සමාගමක් වෙත වර්ෂ 30 ක කාලයක් සඳහා 2011 වර්ෂයේදී බදු දී තිබුණු අතර, ව්‍යාපෘතිය පවත්වාගෙන යාමේ දුෂ්කරතා හේතුවෙන් ඉඩම නැවත භුක්තිය පවරා ගන්නා ලෙස සමාගම විසින් 2016 වර්ෂයේ අවස්ථා 02 කදී ලිපි මගින් සභාව දැනුවත්කර තිබුණ ද, අදාළ ඉඩම කොමිෂන් සභාව වෙත පවරා ගැනීමට හෝ රු.2,139,879 ක හිඟ මුදල අයකරගැනීමට කොමිෂන් සභාව කටයුතුකර නොතිබුණි. | 2016.02.22 දින සිට 2018.08.11 දින දක්වා කාලය තුළ නිෂ්පාදන ක්‍රියාවලිය සිදුනොවූ හෙයින් හිඟ බදු මුදල් ගෙවීමෙන් නිදහස් කිරීමට 2018.08.02 දින පැවති 712 වන කොමිෂන් සභා වාරයේදී තීරණය කර ඇත. | අදාළ ඉඩම කොමිෂන් සභාව වෙත පවරා ගැනීමට හා හිඟ මුදල් අය කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | මාතලේ දිස්ත්‍රික්කයේ පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි අකුරම්බඩ වත්ත නැමැති ඉඩමට අයත් අංක 2011/133 දරන පිඹුරේ කැබලි | 2022.01.11 වන දින කොමිෂන් පත්‍රිකා අංක 11683 හි සඳහන් පරිදි මෙම ඉඩම බදු පදනම මත ලබා දීමට ගත් තීරණය අවලංගු කර ඉඩම් | නියමිත විධි විධාන යටතේ පමණක් ඉඩම් පැවරීම සිදුකළ යුතු අතර හිඟ මුදල් |

| | | | |
|---|---|---|---|
| | අංක 01 න් දැක්වෙන අක්කර 02 රූඩ් 03 පර්චස් 37.13 ක් වූ ඉඩම පල්ලේපොල ප්‍රාදේශීය සභාව වෙත ක්‍රීඩාංගනයක් ඉදිකිරීම සඳහා 2007 වර්ෂයේ සිට වසර 30 ක කාලයක් සඳහා බදු පදනමට ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.2,242,000 ක හිඟ බදු මුදල අයකර ගැනීමට කොමිෂන් සභාව කටයුතුකර නොතිබුණි. | බැහැර කිරීම සම්බන්ධයෙන් අංක 2021/01 චක්‍රලේඛනයේ 04 (ඇ) 1 යටතේ පළාත් පාලන ආයතන සඳහා ඉඩම් ලබාදීමේදී වරිපනම් සීමාවෙන් පිටත පිහිටි ක්‍රීඩාපිටි සඳහා පර්. 1 ක් රු. 100 බැගින් අයකර විකිණීමෙන් පවරා දීමට අනුමත කර ඇති අතර, ඒ සඳහා අයවිය යුතු මුදල් අයකර ගෙන 2022.10.17 ඔප්පු සැකසීමට යොමු කර තිබේ. එසේම, කොමිෂන් සභාව වෙත ලැබිය යුතු හිඟ බදු මුදල් අයකර ගැනීමට අවශ්‍ය නොවන බවටත් කොමිෂන් සභාව තීරණය කර ඇති අතර, ඒ අනුව 2022.12.31 දිනට ගිණුම් වාර්තාවල ගැලපීම් සිදුකරන බව දන්වා සිටිමි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. හිඟ මුදල් ලියා හැරීම සිදු කරන්නේ නම් මු.රෙ.113 ට අනුකූලව සිදු විය යුතුය. |
| (ඊ) | කළුතර දිස්ත්‍රික්කයේ කාලවිලවත්ත ඉඩමෙන් රූඩ් 02 පර්චස් 9.94 ක බිම් ප්‍රමාණය සංචාරක නිවාඩු නිකේතනයක් ඉදිකිරීම සඳහා 2001 සැප්තැම්බර් 19 දින අංක 8502 දරන බදු ගිවිසුම මගින් පෞද්ගලික සමාගමක් වෙත බදු දී තිබුණු අතර, බදු ගිවිසුම අනුව බදුකරු විසින් සෑම වර්ෂයකම ජූලි 11 හෝ ඊට පෙර බදුකුලිය ගෙවිය යුතු වුවද, අදාළ සමාගම විසින් 2002 වර්ෂයේ සිට බදු මුදල් ගෙවීම පැහැර හැර තිබුණි. ඒ අනුව බදුකරු විසින් බදු ගිවිසුමේ කොන්දේසි කඩකර ඇති විටකදී, ඒ බව මාස 06 කට පෙර ලිඛිතව බදුකරු වෙත දැනුම් දී බදු ගිවිසුම අවලංගු කිරීමට සහ සමාලෝචිත වර්ෂය අවසන් වන විට පැවති රු.27,945,900 ක හිඟ බදු අයකර ගැනීමට කොමිෂන් සභාව කටයුතුකර නොතිබුණි. | පිඹුරු අංක 390 හි කැබලි අංක 10 හි අනවසර සන්තකය දරන සදළු ඉන්ටර්නැෂනල් සමාගම ඉවත් කිරීම සඳහා අස් කිරීමේ දැන්වීමක් 2022.05.31 දින යොමු කර ඇති අතර සහ එම පිඹුරෙහිම කැබලි අංක 11 හි අනවසරකරු ඉවත්කිරීමට කළුතර මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 30571 දරන නඩුව ගොනු කර ඇත. මෙම නඩුව 2022.12.02 දින නැවත කැඳවීමට නියමිතය. | ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ගිවිසුම අවලංගු කිරීමට සහ හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | කොමිෂන් සභාව සඳහා, පූර්ණ ඒකාබද්ධ පරිගණක පද්ධතියක් නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා 2002 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් වෙත ගෙවා තිබුණු රු.17,000,000 ක මුදල නැවත ලබා ගැනීමට හෝ අදාළ පරිගණක පද්ධතිය ස්ථාපිත කරගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභාව කටයුතුකර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් 2016.08.21 ,2018.08.31,2021.07.27, 2022.10.17 යන දිනයන්හි විස්තරාත්මක ලිපි යොමු කරමින් රේඛීය අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්යෙන් විමසා ඇත. කෙසේ වෙතත් මේ දක්වා ඒ සම්බන්ධයෙන් නිශ්චිත විසඳුමක් ලබා දී නොමැත. 2022.10.21 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී | පූර්ණ ඒකාබද්ධ පරිගණක පද්ධතියක් නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා ගෙවූ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | රේඛීය අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් දී ඇත්තේ මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමට පියවර ගන්නා ලෙසයි. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | |
| (ඌ) | සභාවේ ඉඩම් මැනුම් කර නියමානුකූල කරන අවස්ථාවේ කට්ටිකරුවන් ගෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට යටත්ව ඉඩම් මැනුම් කර බලයලත් මිනින්දෝරුවන් හට 2019, 2020 හා 2021 යන වර්ෂ වලදී ගෙවා තිබුණු එකතුව රු.33,229,487 ක මුදලින් එම ඉඩම් කට්ටිකරුවන්ට පවරාදී නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.1,140,337 ක් පමණක් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. | මෙම මැනුම් කටයුතු සිදුකර ඇත්තේ 2017.11.23 දින පැවති කොමිෂන් සභා වාරයේ 9980 වන කොමිෂන් පත්‍රිකාවට අදාළව ලබාදෙන ලද තීරණයකට අනුවයි. 2022.09.30 දින වන විට මෙම මැනුම් කිරීම් වලට අදාළව කට්ටිකරුවන් ගෙන් අයකර ගෙන ඇති සම්පූර්ණ මුදල රු.7,804,780 ක් වේ. ඉතිරි මුදල කට්ටිකරුවන් ගෙන් අයකර ගනිමින් පවතී. | අදාල ඉඩම් කට්ටි කරුවන්ට පවරාදීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කර මැනුම් ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (එ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 1.1 ප්‍රකාරව රාජ්‍ය සේවයේ තනතුරක් දරන යම් නිලධාරියෙක් රාජ්‍ය සේවයේ වෙනත් තනතුරක සේවය භාරගැනීම සඳහා තමා දරන තනතුරෙන් මුදවා ගත යුතු වුවද, එසේ නොමැතිව එක් නිලධාරියෙකු 2020 ඔක්තෝම්බර් 23 දින සිට 2022 මාර්තු 31 දින දක්වා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරේ සේවය කරමින් සිටියදී, 2021 ජනවාරි 01 දින සිට මග නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන) තනතුර සඳහා වසරක පරිවාස කාලයකට යටත්ව ස්ථිර පදනම මත සේවයට බැඳී තිබුණි. එකම කාලය තුළ ආයතන 02 න් ලබාගෙන තිබුණු වැටුප් හා දීමනා වටිනාකම රු.4,347,460 ක් වී තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව විසින් අදාළ නිලධාරියාගේ පැමිණීම සහ කාර්ය සාධනය පිළිබඳව සැලකිලිමත් නොවී වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 47 (3) වගන්තිය යටතේ අමාත්‍යවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව නීතිඥ පී.ඒ. හසිත කුමාර ව්‍යාපෘති හා විමර්ශන අධ්‍යක්ෂවරයෙකු ලෙස බඳවාගෙන පැමිණීමේ විස්තර හා වැඩසටහන් විස්තරයන් පදනම් කරගෙන වැටුප් හා දීමනා ගෙවා ඇත. අදාළ නිලධාරියා මග නැගුම මාර්ග ඉදි කිරීමේ යන්ත්‍රෝපකරණ සමාගමෙහි සේවය කිරීම සහ ඊට අදාළ තොරතුරු ලබාගැනීම සඳහා 2022.10.27 හා 2022.11.15 දිනැති ලිපි මඟින් විමසා ඇති අතර මේ වන තෙක් ඒ සඳහා පිළිතුරු ලැබී නොමැති අතර එකී තොරතුරු ලැබීමෙන් පසුව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තීරණයක් ලබාගන්නා බවත්, එකී තීරණය ලබාගත් වහාම ඔබ වෙත වාර්තා කරන බවත් දන්වමි. | අදාළ නිලධාරියාගේ සේවයට පැමිණීම පිළිබඳව මගනැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගමෙන් තහවුරුවක් ලබා ගැනීම හා වැඩියෙන් ගෙවා ඇති වැටුප් සහ දීමනා ආපසු අයකර ගැනීමට මෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඒකාබද්ධ ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් 2019 මැයි 22 දින රු.8,500,000 කට මිලදී ගෙන තිබුණ ද, එම තොරතුරු පද්ධතිය මගින් ලැබිය යුතු ඉඩම් බදු මුදල් පිළිබඳ තොරතුරු ලබාගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. | ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය මඟින් දෙසැම්බර් 31 දින වන විටත් ලැබිය යුතු ඉඩම් බදු මුදල් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට නොහැකි වී ඇත්තේ ආයතනයේ බදු ඉන්වොයිස් නිකුත් කිරීම සම්බන්ධයෙන් මතු වී ඇති ප්‍රායෝගික ගැටලුවකි. එම ගැටලුව විසඳීම මසක කාලයක සිදුකර අදාළ තොරතුරු පද්ධතිය මඟින් ලැබිය යුතු ඉඩම් බදු මුදල් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට හැකිවන ලෙස සකස් කිරීමට කටයුතු කරනු ලබයි. | ඒකාබද්ධ ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය මගින් ගිවිසුම්ගත සියලු තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සකසා ගත යුතුය. |
| (ඔ) | එකතුව රු.1,218,834 ක් වූ සමාලෝචිත වර්ෂයේ මාර්තු මස මිල දී ගෙන තිබුණු ටැබ්ලට් පරිගණක 09 ක් පිළිබඳ තොරතුරු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව තුළ ඇතුළත්ව නොතිබුණු අතර අදාළ භාණ්ඩ නිකුත් කළ සහ ඒවා භාරගත් නිලධාරීන් පිළිබඳ තොරතුරු ගොනු ගත කර නොතිබුණි. | කොමිෂන් සභා සාමාජිකයින් සඳහා මිලදී ගනු ලබන ටැබ්ලට් පරිගණක 09 ක්, 2021.03.14 වන දින අධ්‍යක්ෂ පාලන වෙත නිකුත් කර ඇති අතර එම ටැබ්ලට් පරිගණක කොමිෂන් සභා සාමාජිකයින් වෙත නිකුත් කරන ලද විස්තර ඇතුළත් ගොනුවක් පාලන අංශය විසින් පවත්වාගෙන යනු ලබයි. අදාළ ටැබ්ලට් පරිගණක කොමිෂන් සභා සාමාජිකයින් වෙත ලබා දී ඇති බැවින් වර්ෂ අවසාන භාණ්ඩ සමීක්ෂණයේදී එය වැරදීමකින් මග හැරී ඇති අතර 2022 වර්ෂයේ අවසාන භාණ්ඩ සමීක්ෂණයේදී එය නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | මිලදී ගත් ටැබ්ලට් පරිගණක නිකුත් කළ නිලධාරීන් පිළිබඳ විස්තර ගොනුගත කළ යුතු අතර ඉන්වෙන්ට්‍රි ලේඛනයක් යාවත්කාලීනව නඩත්තු කළ යුතුය. |
| (ඕ) | කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.11,777,501 ක් වැයකර මිලදී ගෙන තිබුණු ලැප්ටොප් පරිගණක 53 ක් ද ඇතුළුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැප්ටොප් පරිගණක 59 ක් පවතින බව ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් වුවද, එදිනට ඉදිරිපත් කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව, කොමිෂන් සභාව සතුව ලැප්ටොප් පරිගණක 27 ක් පවතින බව වාර්තාකර තිබුණි. ඒ අනුව ලැප්ටොප් පරිගණක 30 ක වෙනසක් පැවතුණි. | ලැප්ටොප් පරිගණක වලට අදාළ කේත පලුදු වීම හා ගැලවීම හේතුවෙන් යන්ත්‍රයට කේත කියවීමට නොහැකි වී ඇති බැවින් අපගේ තොරතුරු පද්ධතියට එම පරිගණක 30 ඇතුළත් වී නොමැත. නමුත් භෞතිකව පරිගණක 59 ක් ඇත. මෙම තත්ත්වය ඉදිරියේද නිවැරදි කිරීමට කටයුතු කරනු ලබයි. | භාණ්ඩ සමීක්ෂණය සඳහා සියලුම පරිගණක ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ක) | කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය පවත්වා ගෙන යාම වෙනුවෙන් 2016 දෙසැම්බර් 01 දින සිට 2017 නොවැම්බර් 30 දක්වා වසරක කාලයක් සඳහා බත්තරමුල්ල ප්‍රදේශයේ පිහිටි පෞද්ගලික සමාගමකට අයත් ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබාගෙන තිබුණද, එම ගිවිසුම දීර්ඝ කිරීමකින් තොරව කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය එම ගොඩනැගිල්ලෙහිම පවත්වා ගෙන යමින් රජයේ තක්සේරු වටිනාකමට වැඩියෙන් රු.29,937,867 ක් ගෙවා තිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව බදු පදනම මත ලබාගෙන තිබුණු අතර, අදාළ බදු ගිවිසුමේ කාලය 2017.11.30 වන දින අවසන් වී ඇත. වෙනත් ස්ථානයක් සොයා ගැනීමට නොහැකි වීම මත කොමිෂන් සභා තීරණ පරිදි සියයට 5 ක වැඩිවීමක් සමඟ ගෙවීම් කර ඇත. කුලී පදනම මත ගොඩනැගිල්ලක් සපයා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියට සැලකිය යුතු කාලයක් ගත වන බැවින් මෙම ගොඩනැගිල්ලම තවත් වසරක කාලයක් සඳහා විධිමත් බදු ගිවිසුමක් යටතේ ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කැබිනට් පත්‍රිකාවක් කෙටුම්පත් කර 2022.11.16 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. | රාජ්‍ය වියදම් කාර්යක්ෂමව, ඵලදායීව හා සකසුරුවම්ව සිදුකළ යුතු අතර අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව වියදම් කළමනාකරණය කර ගත යුතුය. |
| (ග) | 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ විධිවිධාන ප්‍රකාරව ඉඩම් අක්කර 50 ට වැඩි ප්‍රමාණයක් හිමි පුද්ගලයන්ගේ ඉඩම් රජයට පවරා ගැනීම යටතේ 1972–1974 අතර කාලසීමාව තුළ ඉදිරිපත් කරන ලද ප්‍රකාශන 260 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 48 කට වැඩි කාලයක් ගත වී තිබුණ ද ව්‍යවස්ථාපිත නිශ්චය ලබා දීමට නොහැකි වී තිබුණි. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2021.11.17 දින ලබා දී ඇති උපදෙස් පරිදි ව්‍යවස්ථාපිත නිශ්චය ලබා දී නොමැති ලිපිගොනු 260 ට අදාළ ප්‍රකාශකයින් දැනුවත් කිරීම සඳහා භාෂා ත්‍රිත්වයෙන්, 2022.04.11 දින පුවත්පත් දැන්වීමක් පළකළ අතර රජයේ අංක 2282 සහ 2022.05.27 දිනැති ගැසට් පත්‍රයක් මඟින්ද, දැනුවත් කරමින් 2022.06.30 දිනට පෙර ඉඩම් උපරිම සීමා අංශයට පැමිණෙන ලෙසට දැනුම් දී තිබුණි. එහිදී ප්‍රතිචාර ලද 38 දෙනෙකුට අදාළව ඉදිරි කටයුතු සිදුකරමින් පවතින අතර, ගැසට් පත්‍රයේ පළකළ හැකි සංඛ්‍යාව 05 ක්, උපරිමයට අඩු සංඛ්‍යාව 01 ක් සහ හිමිකම් බැලීමට යොමු කළ සංඛ්‍යාව 01 ක් වේ. ආපසු ලැබුණු ලිපි සංඛ්‍යාව හා ප්‍රතිචාරයක් නොලද ගොනු 215 සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම ගැටලු සහගත වේ. මේ වන විට නීතිමය බැඳීම්වලට අදාළ ගැටලු 51 සඳහා නිර්දේශයන් කොමිෂන් සභාව වෙත ලබාදී ඇත. මේ වන විට කොමිෂන් සභාව සතුව පවතින බවට ක්ෂේත්‍රයේ හඳුනාගෙන ඇති ඉඩම් පිළිබඳ තොරතුරු ප්‍රකාශකයින් වෙත | ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ප්‍රකාරව රජයට පවරාගත් ඉඩම් වලට අදාළ ව්‍යවස්ථාපිත නිශ්චය ලබා දීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ලබාදී නීතිමය බැඳීම් ප්‍රමාණයෙන් යම් කොටසක් හෝ නිදහස් කිරීමට කටයුතු කරමි. | |
| (ජ) | කළුතර දිස්ත්‍රික්කයේ හැගල්ල වත්ත ඉඩමෙන් අක්කර 10ක් තේ වගාකිරීමේ ව්‍යාපෘතියක් සඳහා පුද්ගලයෙකුට බදු පදනම මත ලබා දීමට අංක 8393 හා 2013.04.30 දිනැති කොමිෂන් පත්‍රිකා තීරණයට අනුව සභාව කටයුතු කර තිබුණි. 2011 වසරේ සිට මෙම ඉඩමට අදාළ කිසිදු බදු මුදලක් අදාළ බදුකරු ගෙවා නොමැති අතර, වලංගු ගිවිසුමකට එළඹීමටද කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ මූල්‍ය තත්ත්ව විස්තරය අනුව අයවිය යුතු රු.2,560,000 ක මුදල අයකර ගැනීමට හෝ ඉඩම පවරා ගැනීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. | කළුතර දිස්ත්‍රික්කයේ හැගල්ල වත්ත ඉඩමේ අක්කර 10 ක ප්‍රමාණයක් සඳහා වූ බදු මුදල් සකසා ඇතත් අදාළ බදුකරු විසින් වගා කර භුක්ති විඳින ඉඩම් කොටස 2018.06.19 දින නිකුත් කර ඇති මැනුම් නියෝගය පරිදි මැනුම් කර ඇති අංක 3396 පිඹුර අනුව අක්කර 04 ක් බව පැහැදිලි වේ. ඒ අනුව ඉහතින් සඳහන් කළ බදු මුදල අය කිරීමට නොහැකි වන බැවින් අංක 11836 හා 2022.04.26 දිනැතිව කොමිෂන් සභාවට ඉදිරිපත් කර අක්කර 04 ක ප්‍රමාණය භුක්තියට පැමිණි වසරේ සිට වසර 05 න් 05 ට සංශෝධනයට යටත්ව 30 අවුරුදු බදු කාලය සඳහා ලබා දීමට තීරණය කර ඇත. ඒ අනුව රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව ලබා ගැනීම සඳහා 2022.05.06 දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. ඒ අනුව, රජයේ තක්සේරුව 2022.10.26 දින ලැබී ඇති අතර, 2022.11.14 වන දින බදුකරු වෙත බදු දැන්වීම යොමු කර ඇත. | විධිමත් බදු ගිවිසුමක් මත ඉඩම් බදු දීමට හා හිඟ බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ට) | ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22 (1) (ආ) වගන්තිය ප්‍රකාරව, ගාල්ල දිස්ත්‍රික්කයේ අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ලෙව්වමී බී වත්ත නැමැති ඉඩමෙන් අක්කර 08 ක් අවුරුදු 30 ක කාලයක් සඳහා වසර 5න් 5ට බදු සමාලෝචනය කරමින් 2005 වර්ෂයේ තක්සේරු වටිනාකම මත 2005 වර්ෂයේ සිට “සහන ළමා සංවර්ධන පදනමට” බදු පදනම මත ලබා දීමට 2014 කටයුතු කර තිබුණු අතර, අදාළ ඉඩම සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් ඇති වූ බව පවසමින් ඉඩමේ භුක්තිය ඒකපාර්ශිකව කොමිෂන් සභාව වෙත 2021 වර්ෂයේදී පවරාගෙන ඇති බව විගණනයට වාර්තාකර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන දින වන විට හිඟව පැවති රු.6,509,200 ක මුදල අයකර ගැනීමට කොමිෂන් සභාව | අදාළ බදු දීම සඳහා කොමිෂන් සභා අනුමැතිය ලබාදීමට 2014 වර්ෂය දක්වා ප්‍රමාදවීමට අදාළ තොරතුරු ගොනුව මගින් සොයාගත නොහැකි අතර, බදුකරු වන පූජ්‍ය කැගල්ලේ උඩුවේවෙල පඤ්ඤාරාම ස්වාමීන් වහන්සේ 2020.05.18 දින අපවත් වී ඇති බැවින් බදු ගිවිසුමක් ලබා දීමට කටයුතු කර නොමැත. බදුකරු අපවත් වී ඇති බැවින් ද, ඉඩම් කොටස තුළ විවිධ ගැටලු මතු වෙමින් පැවතුන බැවින් ද, අදාළ ඉඩම් කොටසේ භුක්තිය කොමිෂන් සභාවට භාර ගැනීමටත් තීරණය කර 2021.07.28 දින ඉඩමේ ප්‍රායෝගික භුක්තිය ඒක පාර්ශවිකව භාරගෙන ඇත. | පවරාගත් ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ අරමුණු වෙනුවෙන් යොදාගත යුතු අතර හිඟ බදු අය කර ගැනීමට ද පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කටයුතු කර නොතිබුණි. | | |
| (ඩ) | කොමිෂන් සභාව විසින් ව්‍යාපෘති හා විමර්ශන අධ්‍යක්ෂ, ව්‍යාපෘති සම්බන්ධීකාරක, විමර්ශන නිලධාරී, නීති උපදේශක සහ නීතිඥ යන සේවා, සේවා ගිවිසුම් මත රාජකාරී ඉටුකර ගැනීම සඳහා 14 දෙනෙකු සමාලෝචිත වර්ෂයේදී කොමිෂන් සභාව විසින් බඳවාගෙන තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ සේවා ගිවිසුම් වලට එළඹීමට කොමිෂන් සභාව කටයුතුකර නොතිබුණි. ඒ අනුව නිශ්චිතව පවරන ලද රාජකාරියක් ඉටුකරවා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට රු.14,853,725 ක මුදලක් ගෙවා තිබුණි. | 1972 අංක 01 දරන පනතේ කොමිෂන් සභාව සම්බන්ධයෙන් අමාත්‍යවරයාට පවතින බලතල අනුව එකී පනතේ 47(3) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ කාර්යයන් සම්බන්ධව විමර්ශනය කර වාර්තා කිරීම සඳහා තැනැත්තෙකු /තැනැත්තියක පත්කිරීමට ඇති බලතල ප්‍රකාරව විමසුමේ සඳහන් 14 දෙනාගේ සේවය ලබාගෙන ඇති අතර පනතේ 47(3) වගන්තිය ප්‍රකාරව ඔවුන්ට අදාළ පහසුකම් සැපයීම කොමිෂන් සභාව විසින් සිදු කළ යුතුව ඇත. ඒ අනුව අංක 11273 දරන කොමිෂන් පත්‍රිකාව මඟින් අදාළ තනතුරු කොමිෂන් සභාවට වාර්තා කර ඇති අතර 2020.12.31 දින ලද කොමිෂන් සභා තීරණය පරිදි විමසුමේ සඳහන් ගෙවීම් කිරීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සම්බන්ධයෙන් අමාත්‍යවරයාට පවතින බලතල ප්‍රකාරව අදාළ පත්වීම්ලාභීන්ට අමාත්‍යවරයා විසින් (නිශ්චිතව) පවරනු ලබන රාජකාරි පිළිබඳව විමර්ශනය කර අදාළ වාර්තා අමාත්‍යවරයා වෙත යොමු කෙරේ. එසේ වුවත්, අදාළ පත්වීම් කොමිෂන් සභාව විසින් ලබා දී ඇති බැවින් වරින් වර ඔවුන් වෙත විවිධ රාජකාරි කොමිෂන් සභාවේ සභාපති විසින් පවරා ඇත. | විවිධ සේවා ලබා ගැනීමේදී අදාළ පාර්ශවයන් සමග සේවා ගිවිසුම් වලට එළඹීමට සහ අදාළ සේවාව නියමිත කාලය තුළ අවසන්කර ගැනීමට කටයුතු කළ යුතු අතර කාර්යසාධනය සම්බන්ධයෙන් වාර්තා පවත්වා ගැනීම හා ඇගයීමද සිදු කළ යුතුය. |
| (ණ) | සභාපති සහ විධායක අධ්‍යක්ෂ තනතුරු සඳහා නිවාස සහ සංග්‍රහ දීමනා සඳහා හිමිකමක් නොමැති වුවද, එයට පටහැනිව සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දී රු.1,200,000 ක් නිවාස හා සංග්‍රහ දීමනා ලෙස ගෙවා තිබුණි. | මෙම දීමනා ගෙවීම සම්බන්ධව විගණන විමසුම් ඉදිරිපත්වීම හේතුවෙන් 2021.12.07 දින මේ සම්බන්ධයෙන් අංක 11646 දරන කොමිෂන් පත්‍රිකාවක් ඉදිරිපත් කළ අතර, එම කොමිෂන් තීරණය අනුව විගණන විමසුම ප්‍රකාරව අදාළ දීමනා ගෙවීම තාවකාලිකව නතර කිරීමටත්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබාගෙන ඉදිරි කටයුතු කිරීමටත් තීරණය කරන ලදී. එහිදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති සහ විධායක | විධිමත් අනුමැතියක් සහිත දීමනා පමණක් ගෙවිය යුතු අතර ගෙවන ලද අනුමත නොවන දීමනා නැවත අයකළ යුතුය. |

අධ්‍යක්ෂ යන තනතුරුවල නිලධාරීන් සඳහා නිල නිවාස පහසුකම් හිමිකම නොලබන බව හා නිවාස සහ සංග්‍රහ දීමනා ගෙවීම සම්බන්ධයෙන් එකඟවිය නොහැකි බව දන්වා ඇත. නැවත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාව උපදෙස් දෙන ලදී. ඒ අනුව මෙම දීමනා ගෙවීම සම්බන්ධව 2022.04.06 දින නැවත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් විමසීම් කරන ලදී.

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රැස්වීම් පැවැත්වීම සඳහා යොදාගත හැකි (ZOOM වැනි) මෘදුකාංග අන්තර්ජාලය මගින් නොමිලේ බාගතකර ගැනීමට හැකියාව තිබියදී, එසේ නොකර සමාලෝචිත වර්ෂයේ ඔක්තෝම්බර් 21 දින රු.1,160,000 ක් ගෙවා රැස්වීම් පැවැත්වීම සඳහාමිල දී ගෙන තිබුණු“Board Pac'' මෘදුකාංගය එම කටයුතු සඳහා යොදා නොගැනීම හේතුවෙන් ඒ සඳහා දරා තිබුණු මුදල නිෂ්කාර්ය පිරිවැයක් බවට පත් වී තිබුණි. | සාමාන්‍ය රැස්වීම් පැවැත්වීමේ කටයුතු සඳහා “Zoom”වැනි අන්තර්ජාල මෘදුකාංග නොමිලේ බාගත කිරීමේ හැකියාව පැවතිය ද, “BoardPac” මෘදුකාංගය මඟින් ඊට අතිරේකව සුවිශේෂී කාර්යයන් එම මෘදුකාංගය භාවිතයෙන් සිදු කිරීමේ හැකියාව ඇත. එනම් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා උඩුගත කිරීම, එම පත්‍රිකා පරීක්ෂණය හා සංශෝධනය, ඩිජිටල් අත්සන් යෙදීම, න්‍යාය පත්‍ර සකස් කිරීම, රැස්වීම් සටහන් ලබාගැනීම සහ හුවමාරු කරගැනීම ආදිය ඉටුකිරීමේ හැකියාව පවතී. තවද, අන්තර්ජාලය මගින් නොමිලේ බාගත කරනු ලබන Zoom වැනි මෘදුකාංග ආදියට සාපේක්ෂව ඉහළ රහස්‍යභාවයක් සහ ආරක්ෂාවක් මෙම මෘදුකාංගය සතුව පවතී. එබැවින්, මෙම මෘදුකාංගය වෙනුවෙන් වැයකර ඇති මුදල නිෂ්කාර්යය පිරිවැයක් නොවන බවට නිරීක්ෂණය කරමි. | පිරිවැය ප්‍රතිලාභ ඇගයීමෙන් පසු වඩා වාසිදායක අරමුණු වෙනුවෙන් සභාවේ මුදල් වැයකළ යුතු අතර මෙම මෘදුකාංගය නිෂ්කාර්යව පවත්වා ගැනීම සිදු නොකළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------ | -------------- |
| (අ) | අංක අමප/18/1126/829/002 දරන 2018 ජුනි 27 දිනැති කැබිනට් මණ්ඩල තීරණය පරිදි කොමිෂන් සභාව වෙත වාර්ෂිකව සේවය දීර්ඝ කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 214 දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලැබී තිබුණු අතර, ඒ අනුව බඳවාගත් සේවකයින්ගෙන් 180 දෙනෙකු සමාලෝචිත වර්ෂය අවසන් වන විට සේවය කරමින් පැවතුණි. තවද, අදාළ බඳවා ගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්තුමා විසින් සභාපතිතුමා වෙත යොමු කළ අංක 3/1/45 සහ 2021.12.28 දිනැති ලිපියෙහි අනු අංක 02 යටතේ මෙම නිළධාරීන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් ක්‍රියාපාටිය අනුගමනය කරමින් මු.රෙ. 71 අනුව අනුමත කර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. ඒ අනුව එම දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කළ අතර අවසන් වරට 2022.11.03 දින පැවැත් වූ සකච්ඡාව පරිදි එම බඳවා ගත් කාර්යය මණ්ඩලය, ස්ථිර කාර්යය මණ්ඩලයට අනියුක්ත කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට එහිදී තීරණය විය. | අදාළ බඳවා ගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත සේවක සංඛ්‍යාවේ ඇතුළත් මධ්‍යම කළමනාකරණ මට්ටමේ නිලධාරීන් 02 ක්, කළමනාකරණ සහකාර තනතුරු 07 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරක් පුරප්පාඩුව පැවතියද, අවශ්‍යතාවය පරිදි අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට හෝ පුරප්පාඩු පිරවීමට කොමිෂන් සභාව කටයුතුකර නොතිබුණි. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලයේ අවශ්‍යතාවය පරිදි සේවක සංඛ්‍යාව සහ ඊට අදාළ බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධන කෙටුම්පත් සකස් කර ඇත. ඒ සඳහා අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව කැබිනට් තීරණය මගින් බඳවා ගත් සේවකයන් පුරප්පාඩු සඳහා සහ නව තනතුරු සඳහා අනුයුක්ත කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී. | සේවා අවශ්‍යතාවය පරිදි අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට හෝ පුරප්පාඩු පිරවීමට කොමිෂන් සභාව කටයුතු කළ යුතුය. |

## 4.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| -------------------- | -------------------------- | ------------------ |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිත සමාලෝචිත වර්ෂයට අදාළ සංයුක්ත සැලැස්මේ පිටපතක් ඊළඟ මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර | 2018-2022 සංයුක්ත සැලැස්ම අංක පිඑල්/ඒ/එල්ආර්සී/කෝප් - 2022 හා 2022.10.13 දිනැති විගණන විමසුමට අදාළ ඇමුණුම් වශයෙන් ජාතික විගණන කාර්යාලය වෙත ලබා දීමට කටයුතු කර ඇත. කෙසේ වෙතත් මේ වන විට ශ්‍රී ලංකා | සංයුක්ත සැලැස්ම චක්‍රීය ක්‍රමයට සකස් කර නියමිත පරිදි එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| විගණකාධිපති වෙත ලබාදිය යුතු වුවද, කොමිෂන් සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | සංවර්ධන පරිපාලන ආයතනය මඟින් සම්පත් දායකත්වය ලබාගනිමින් එම 2023-2027 සංයුක්ත සැලැස්ම සකස් කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. එය නියමිත කාලය තුළදී විගණකාධිපති වෙත ලබාදීමට කටයුතු කරනු ලැබේ. | |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.6 හි සඳහන් පරිදි කාර්තුමය කාර්ය සාධන වාර්තා කාර්තුව අවසන් වී දින 30 ක් ඇතුළත රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාර වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ කාර්තුමය කාර්ය සාධන වාර්තා චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂයේ රට තුළ පැතිර ගිය කොවිඞ් 19 වසංගතය තත්ත්වය හේතුවෙන් රාජකාරි කටයුතු පවත්වා ගෙන යාමේදී ඇති වූ බාධා හමුවේ කොමිෂන් සභාවේ කාර්තුමය ප්‍රගතිය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමේ දුෂ්කරතා මතුවිය. නමුත් රේඛීය අමාත්‍යාංශය වන ඉඩම් අමාත්‍යාංශය විසින් වරින් වර පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා කාර්තුමය කාර්යය සාධනය ඉදිරිපත් කර ඇත. | කාර්තුමය කාර්ය සාධන වාර්තා නියමිත කාලයට සකස් කර ඉදිරිපත් කළ යුතුය. |